**විද්‍යා හා තාක්‍ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය - 2020**

**-------------------------------------------------------------------**

**විද්‍යා හා තාක්‍ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3698 එස්ආර්අයි හා 3699 එස්ආර්අයි (සීඑල්) ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්‍ෂණ මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**-------------------------------------------------------------------**

**ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කැලණිය විශ්වවිද්‍යාලය, රජරට විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රටේ උසස් අධ්‍යාපන පද්ධතියට රැකියාභිමුඛ තාක්‍ෂණික උපාධි වැඩසටහන් ඇතුළත් කිරීමේ ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 30,051.45 කට සමාන එජඩො මිලියන 165ක් වූ අතර ඉන් රු.මිලියන 26,408.45 කට සමාන එජඩො මිලියන 145 ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 අප්‍රේල් 17 දින පසුගාමී මූල්‍යනය යටතේ ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.**

**1.3 මතය**

**-------**

**ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

**-------------------------**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූල වන විගණනය සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

**------------------------------------------------------------------------------------**

**මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශචය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමේන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

**2.** **භෞතික කාර්යසාධනය**

**2.1** **ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

**ව්‍යාපෘතියේ කටයුතු සංරචක 05 ක් යටතේ ක්‍රියාත්මක වේ.**

**(අ)** **නවීන තාක්ෂණය සහ කාර්මික අංශයට අදාළ අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.**

**(ආ)** **කාර්මික ඉල්ලුම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග ගැලපෙන ආකාරයට ගුණාත්මක විෂයමාලා සැලසුම් කිරීමට සහ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා සහයවීම.**

**(ඇ)** **තරඟකාරි කර්මාන්ත සහ විදේශ විශ්ව විද්‍යාල සහයෝගීතා යෝජනා ක්‍රම සැපයීම.**

**(ඈ)** **ධාරිතා වර්ධන අවස්ථා**

**(ඉ)** **2021 වර්ෂයේ අනුමත කිරීම සඳහා යෝජනා කරන නව උසස් අධ්‍යාපන ව්‍යාපෘති සකස් කිරීමේදී රජයට සහය ලබාදීම.**

| සංරචකය | ක්‍රියාකාරකම් | ආරම්භ කිරීමට සැලසුම් කළ කාලය | ආරම්භ කළ දිනය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) නවීන තාක්ෂණික ඉගෙනුම් හා පර්යේෂණ පරිසරයක් ස්ථාපනය කිරීම. | නිර්මාණය සහ ඉදිකිරීම් පදනම යටතේ රජරට විශ්ව විද්‍යාලය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ලංසු ලියවිලි සකස් කිරීම. | 2018 වර්ෂය තුළදී | මේ දක්වා ආරම්භ කර නොතිබුණි. | ඉදිකිරීම් හතරකි. ව්‍යාපෘතියේ කාර්යමණ්ඩලය යෙදවීමේ ප්‍රමාදය හේතුවෙන් පීය ගොඩනැගිලි හතරෙහි සිවිල් වැඩ ප්‍රසම්පාදනය 2018 වර්ෂය අවසානයේදී ආරම්භ කර තිබුණි. | ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට සහ අමතර පිරිවැය වළක්වා ගැනීමට කාලීනව කොන්ත්‍රාත් වැඩ අවසන් කර ගැනීම සහතික කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) නවීන තාක්ෂණික ඉගෙනුම් හා පර්යේෂණ පරිසරයක් ස්ථාපනය කිරීම | විස්තරාත්මක සැලැස්ම අනුමත කිරීම, ඉදිකිරීම් සැලැස්ම නිම කිරීම සහ කැලණිය, රජරට, ශ්‍රී ජයවර්ධනපුර හා සබරගමුව විශ්ව විද්‍යාලවල සිවිල් වැඩ ආරම්භ කිරීම. | 2019 4 වන කාර්තුවේ | ඉදිකිරීම් කටයුතු මේ දක්වා ආරම්භ කර නොමැත. | ඉදිකිරීම් හතරකි. ව්‍යාපෘතියේ කාර්යමණ්ඩලය යෙදවීමේ ප්‍රමාදය හේතුවෙන් පීය ගොඩනැගිලි හතරෙහි සිවිල් වැඩ ප්‍රසම්පාදනය 2018 වර්ෂය අවසානයේදී ආරම්භ කර තිබුණි. | ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට සහ අමතර පිරිවැය වළක්වා ගැනීමට කාලීනව කොන්ත්‍රාත් වැඩ අවසන් කර ගැනීම සහතික කර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) ගුණාත්මක සහ කාර්මික අංශයට අදාළ උසස් තාක්ෂණික අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | කාන්තා සහභාගීත්වයෙන් යුතු සේවානියුක්ති කේන්ද්‍ර කර ගත් නව උපාධි වැඩසටහන් ඇතුළුව කාර්මික ව්‍යවස්ථාව මෙහෙයවීම | **2018** වර්ෂය තුළදී | **2020** වර්ෂයේදී | - | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ සඳහන් අවශ්‍යතාවයන් සමග අනුකූල වීම අවශ්‍ය වේ. |
| (ඈ) පීය කළමනාකරණ ධාරිතාවය සවිබල ගැන්වීම | විශ්ව විද්‍යාල හතරෙහි කාන්තාවන් සඳහා විශේෂ වැඩසටහන් ඇතුළත්ව වෘතීය මාර්ගෝපදේශ සහ රැකියා සඳහා මගපෙන්වන මධ්‍යස්ථාන සඳහා මෙහෙයුම් අත්පොත් සංවර්ධනය කිරීම | **2019 2** වන කාර්තුවේ | **2020** | - | තවදුරටත් ප්‍රමාදවීමකින් තොරව ප්‍රමාදවූ කටයුතු ආවරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) නව උසස් අධ්‍යාපන ව්‍යාපෘති සකස් කිරීම සඳහා සහය ලබාදීම | උසස් අධ්‍යාපනය හෝ නවෝත්පාදන සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ සැලසුම් අංග ඇතුලත්ව සංකල්ප පත්‍රය සකස් කිරීම. | **2019 1** වන කාර්තුවේ | මේ දක්වා ආරම්භ කර නොමැත. | - | තවදුරටත් ප්‍රමාදවීමකින් තොරව ප්‍රමාදවූ කටයුතු ආවරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.2** කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------------

| | විගණන ගැටලු | කළමනාකරණ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | **2017** ජනවාරි රජරට, සබරගමුව, කැළණිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලවල පීය ගොඩනැගිලි **04**ක් ඉදිකිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනිමේ පිළිබඳ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබුණද, එ.ජ.ඩො. මිලියන **67.5**ක ඇස්තමේන්තුගත පිරිවැයකට **2017** | ඉදිකිරීම් හතරකි. ව්‍යාපෘතියේ කාර්යමණ්ඩලය යෙදවීමේ ප්‍රමාදය හේතුවෙන් පීය ගොඩනැගිලි හතරෙහි සිවිල් වැඩ ප්‍රසම්පාදනය **2018** වර්ෂය අවසානයේදී ආරම්භ කර තිබුණි. | ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට සහ අමතර පිරිවැය වළක්වා ගැනීමට කාලීනව කොන්ත්‍රාත් වැඩ අවසන් කර ගැනීම සහතික කර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ජනවාරි ආරම්භ කරන ලද පීඨ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සබරගමුව, කැළණි සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාල පමණක් නිම කර තිබුණි. | | |
| (ආ) | රජරට විශ්ව විද්‍යාලයේ පීඨ ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ කටයුතු පිරිනමා තිබුණද, ලංසු ක්‍රියාවලියේ ප්‍රගතිය **2020** අප්‍රේල් **30** විගණිත දින වන විටත් අවසන් කර නොතිබුණි. තවද, ඉදිකිරීම් වැඩබිමෙහි අධිබලැති රැහැන් ඉවත් කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත ව්‍යාපෘති අරමුදල් රු.මිලියන **11** ගෙවා තිබුණි. | - | ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට සහ අමතර පිරිවැය වළක්වා ගැනීමට කාලීනව කොන්ත්‍රාත් වැඩ අවසන් කර ගැනීම සහතික කර ගැනීමට පියවර ගත යුතුය. |

**2.3** ඌන උපයෝජිත සම්පත්

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියේ ආරම්භ කර වර්ෂ **03** ගතවීමෙන් පසුව **2020** දෙසැම්බර් **31** දිනට එ.ජ.ඩො මිලියන **145** ණය මුදලින් සියයට **6.8**ක් නියෝජනය කරන එ.ජ. ඩො. මිලියන **9.86**ක් පමණක් උපයෝජනය කර තිබුණි. | ආසියානු සංවර්ධන බැංකුවේ සංශෝධිත වියපැහැදම් සැලැස්ම අනුව, අපේක්ෂිත වියපැහැදම එ.ජ.ඩො. මිලියන **18.59**ක් වන බව පිළිගැනේ. කෙසේවෙතත්, සිවිල් කටයුතුවල ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් නොවැළැක්විය හැකි හේතූන් නිසා **2020** දෙසැම්බර් **31** දිනට පෙර කැළණිය සහ සබරගමුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණික පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත් **03** පමණක් අපට පිරිනැමීමට හැකිවිය. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී ව්‍යාපෘතියේ අරමුණු ලඟාකර ගැනීමට පියවර ගත යුතුය. |

**2.4** මතභේදයට තුඩුදෙන ගැටලු

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජන ඉලක්කය එ.ජ.ඩො. මිලියන **42.5** සිට එ.ජ.ඩො. මිලියන **18.59**ක් දක්වා අඩුකර | ව්‍යාපෘති ගිවිසුම **2019.01. 17** දින අත්සන් කර තිබුණු අතර ණය බලාත්මක වන දිනය **2019.04.04** වන බව කාරුණිකව දන්වනු | අරමුදල් උපයෝජනයේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට ව්‍යාපෘතියේ |

| | | | |
|---|---|---|---|
| | තිබුණු අතර කිසිදු පිළිගත හැකි හේතුවකින් තොරව ව්‍යාපෘතියේ ආරම්භ කිරීමේ වර්ෂය **2018** වර්ෂයේ සිට **2019** වර්ෂය දක්වා වෙනස් කර තිබුණි. එමනිසා අරමුදල් උපයෝජනය සහ ව්‍යාපෘති කාලයට කරන ලද සංශෝධනයන් හේතුවෙන් ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී ව්‍යාපෘතියේ අදාළ කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි. | ලැබේ. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් උපයෝජන ඉලක්කය එ. ජ. ඩො. මිලියන **18.59**ක් දක්වා අඩුකර තිබුණි. | කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතුය. |
| (ආ) | **2020** දෙසැම්බර් **31** දිනට කෙරී ගෙන යන වැඩ ලෙස දරා තිබුණු රු. මිලියන **76.9**කින් මුළු වියදමින් සියයට **69**ක් නියෝජනය කරන එකතුව රු. මිලියන **52.8**ක් ව්‍යාපෘති කළමනාකරණ වියදම් ලෙස දරා තිබුණි. | ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව එම වියදම් කාණ්ඩ වර්තන වියදම් ලෙස ජංගම වත්කම් යටතේ වෙනත් කෙරී ගෙන යන වැඩ ලෙස ඇතුළත් කර තිබුණි. ඒ අනුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය පුරා අඛණ්ඩව සිදු කෙරෙන උපදේශන, දිගුකාලීන පුහුණු, කෙටිකාලීන පුහුණු සහ ව්‍යාපෘති කළමණාකරණ වියදම් වැනි වියදම් වෙනත් කෙරී ගෙන යන වැඩ යටතේ දක්වා ඇත. | අරමුදල් උපයෝජනයේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට ව්‍යාපෘතියේ කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය කැළණිය, රජරට සහ සබරගමුව විශ්ව විද්‍යාල සඳහා කොවිඩ්-**19** ආරක්ෂක උපකරණ සහ භාණ්ඩ මිලදී ගැනීමට එකතුව රු. මිලියන **4.3**ක් වියදම් කර තිබුණි. කෙසේවෙතත්, එම කටයුතු ව්‍යාපෘතියේ වැඩ විෂය පථය යටතේ නොගැනේ. | කොවිඩ්-**19** ආරක්ෂක උපකරණ සහ භාණ්ඩ මිලදී ගැනීම ව්‍යාපෘතියේ වැඩ විෂය පථය යටතට නොගැනෙන බව පිළිගැනේ. කෙසේවෙතත්, මෙය හදිසි සහ අපේක්ෂිත තත්ත්වයක් නිසා ව්‍යාපෘතියේ විෂය පථය නොසලකා ආසියානු සංවර්ධන බැංකුව ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කරමින් කොවිඩ්-**19** ආරක්ෂක උපකරණ සහ භාණ්ඩඩ මිලදී ගැනීමට අනුමැතිය ලබාදී ඇත. | ව්‍යාපෘතියේ අරමුණු සමඟ අනුකූලවීම අවශ්‍ය අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

**2.5** පද්ධති හා පාලනයන්

| | විගණන ගැටලු | කළමනාකරණ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2020 ක්‍රියාකාරී සැලැස්ම අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 217.63ක් වන ප්‍රසම්පාදන කටයුතු 23ක් නිම කළ යුතුවේ. කෙසේවෙතත්, ඉහත ප්‍රසම්පාදන කටයුතු 2021 අප්‍රේල් 30 දිනට සම්පූර්ණ කර නොතිබුණි. | - | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරන ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ නියාමනය සහ අධීක්ෂණය පිළිබඳව ඉහළ සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්මට අනුව, 2019 වර්ෂයේදී විශ්ව විද්‍යාල 03ක් ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 292.9ක ප්‍රසම්පාදන කටයුතු 14ක් නිම කිරීමට ඉලක්ක කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී ඉහත ප්‍රසම්පාදන කටයුතු නිම කිරීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. | - | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරන ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ නියාමනය සහ අධීක්ෂණය පිළිබඳව ඉහළ සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. |